දෙවිනුවර ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොඩනැගිලි ඉදිකිරීම් එකතු වටිනාකම රු.මිලියන 7.39 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකර තිබුණු නමුත් එම ඉදිකිරීම් සිදුකළ ඉඩම් 11 හි වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොමැති සියලු ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමටත් එම ලැයිස්තු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමටත් කටයුතු කරන බව.	ඉදිකිරීම් සිදුකරන ලද ඉඩම් 11 හි අගය ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කළයුතු ලෙස හඳුනාගත් යන්ත්‍ර හා උපකරණ 10 ක පිරිවැය නිශ්චිතව හඳුනාගැනීමෙන් තොරව රු.මිලියන 0.43 ක් 2018 ජනවාරි 01 දිනට තිබූ හඳුනා නොගත් ශේෂයෙන් කපාහැර තිබුණි.	ස්ථාවර විෂය නිලධාරී මඟින් එම කටයුතු කඩිනමින් ඉටු කරවාගෙන මෙහි සඳහන් දෝෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	ඉවත් කළ යුතු බවට හඳුනාගත් යන්ත්‍ර උපකරණ 10 හි පිරිවැය නිශ්චිතව හඳුනාගෙන පොත්වලින් ඉවත් කළ යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂයේදී හඳුනා නොගත් ලීබඩු හා උපකරණ ශේෂයෙන් භාණ්ඩ සමීක්ෂණය මඟින් අපහරණය කළ භාණ්ඩවල වටිනාකම නිශ්චිතව හඳුනා ගැනීමෙන් තොරව රු.මිලියන 0.10 ක අගයක් 2018 ජනවාරි 01 දිනට හඳුනා නොගත් ශේෂයෙන් කපා හැර තිබුණි.	ස්ථාවර විෂය නිලධාරී මඟින් එම කටයුතු කඩිනමින් ඉටු කරවාගෙන මෙහි සඳහන් දෝෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	ඉවත් කළ යුතු බවට හඳුනාගත් ලී බඩු හා උපකරණ පිරිවැය නිශ්චිතව හඳුනාගෙන පොත්වලින් ඉවත් කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, විස්තරාත්මක උපලේඛන, අයිතිය සනාථ කිරීමේ ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, බඩු වට්ටෝරු පොත් යනාදී ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා රු.මිලියන 108.87 ක් වූ ගිණුම් විෂයයන් 04 ක ශේෂ සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂ තහවුරු කරන ස්ථාවර වත්කම් ලේඛන, විස්තරාත්මක උපලේඛන, බඩු වට්ටෝරු පොත් ඉදිරිපත් කළ යුතුය.

1.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 139 හා 387	2024 සැප්තැම්බර් 30 දිනට ජංගම ගිණුමේ පැවති ශේෂය රු.මිලියන 1.24 ක් වුවද, එය නොසලකා මුදල් පොතෙන් රු.මිලියන 4.01 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණි.	අතපසු වීමක් බැවින් ඉදිරියේ දී එසේ නොවීමට වග බලා ගන්නා බව	ජංගම ගිණුමේ පැවති ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීම සම්බන්ධව විෂය නිලධාරියාට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 35.96 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 31.49 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම	2024 බිල්කළ ආදායම	2024 රැස්කළ ආදායම	2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන්තුගත ආදායම	2023 බිල්කළ ආදායම	2023 රැස්කළ ආදායම	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	3,302,179	2,642,326	3,055,760	5,793,704	3,585,236	2,887,132	2,733,790	6,207,138
(ii)	කුලී	28,574,200	32,882,656	35,490,582	10,094,515	26,595,120	28,887,419	30,825,118	12,702,441
(iii)	බලපත්‍ර ගාස්තු	4,001,200	3,746,556	3,699,056	121,250	3,399,900	4,184,864	4,160,404	73,750
(iv)	වෙනත් ආදායම්	13,807,714	10,419,022	10,303,640	3,582,838	16,410,800	10,744,038	7,793,138	3,467,456
		49,685,293	49,690,560	52,549,038	19,592,307	49,991,056	46,703,453	45,512,450	22,450,785

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.මිලියන 6.02 වූ හිඟ වරිපනම් ශේෂයෙන් රු.මිලියන 1.38 ක් පමණක් අයකර තිබුණි. තවදුරටත් අයවිය යුතු හිඟ වරිපනම් ශේෂයෙන් රු.මිලියන 4.18 ක් වසර 5 ඉක්මවා තිබුණි.	හිඟ අය කර ගැනීම සඳහා ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගෙන් ගෙට යාමේ වැඩසටහන්, ප්‍රචාරණ වැඩසටහන් දිගින් දිගටම ක්‍රියාත්මක කරමින් හිඟ අය කිරීමට කටයුතු කළ අතර, රතු නිවේදන නිකුත් කරමින් හිඟ වරිපනම් අය කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය.
(ii)	1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කර වාර්ෂික වටිනාකම මත වරිපනම් අයකළ යුතු නමුත් සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 07 ක වරිපනම් ඒකක 3300 කට අදාළ දේපළ 2011 වර්ෂයෙන් පසුව තක්සේරු කර නොතිබුණි.	2025 ජනවාරි 15 දින දෙවිනුවර ප්‍රාදේශිය සභාවේ නව තක්සේරු ප්‍රතිශෝධනය සිදු කරන ලද බව.	බදු හා තක්සේරු කරන ආඥා පනත අනුව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුය.

(iii)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාම නිලධාරී වසම් 16 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන 2016 අගෝස්තු 12 දිනැති අංක 1980 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර තිබුණද, එහි දේපල හඳුනාගෙන තක්සේරු කර වරිපනම් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	2016 වර්ෂයේ ගැසට් කිරීම සිදු කර තිබුණද එම ගැසට් පත්‍රයේ අඩුපාඩු පවතින බව දන්වා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත යොමු කර අතර, එම අඩුපාඩු සකස් කිරීම සඳහා අවශ්‍ය සීමා නිර්ණ සිතියම් පිළියෙල කරමින් පවතින බව.	හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.77,249 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් කිසිඳු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.	2024 වර්ෂය තුල නව අක්කර බදු සමීක්ෂණ කමිටුවක් පත් කළ ද එම කමිටුව මඟින් කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය.

(ආ) කුලී

(i)	යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් සභාවට අයවිය යුතු වසර 5 ක් ඉක්මවා තිබූ රු.මිලියන 0.15 ක කුලී මුදල් අයකර ගැනීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් පත් කරන ලද කමිටු නිර්දේශය පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	වෙළෙඳ ස්ථාන බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.මිලියන 11.62 ක ශේෂයෙන් රු.මිලියන 1.54 ක් වසර 2 ත් 5 ත් අතර හා රු.මිලියන 5.05 ක් වසර 5 කට අධික කාලයක සිට පැවත එන ශේෂයක් වූ නමුත් හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වෙමින් පැවතුණි.	රු. 100,000 ට වැඩි හිඟ ශේෂ පැවති කඩ කාමර 02 න් රු.37,640 බැගින් තවදුරටත් අයවීමට ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.මිලියන 0.83 ක් වූ හිඟ කුලී ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිඳු මුදලක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	වසර ගණනාවක් තිස්සේ පැවත එන ශේෂයක් බව.	හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

(iv)	දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති හා අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය අනුව බදුකරුවන් සමඟ එළඹ ඇති ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, එසේ නොකිරීම නිසා සභාව සතු වෙළෙඳ සංකීර්ණ 07 ක කඩ කාමර 76 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණි.	නීතිමය කටයුතු සඳහා යොමුකර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව ගිවිසුම් කල් ඉකුත් වූ කඩ කාමර සඳහා කඩිනමින් ගිවිසුම්ගත විය යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභා බලප්‍රදේශයෙන් එක්රැස් කරනු ලබන දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කටයුතු හා නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකර, එක්රැස් කරනු ලබන නොදිරන කසළ විධිමත් ක්‍රමවේදයකින් තොරව වැල්ලමඩම මෝලවත්ත නමැති ඉඩමට බැහැර කිරීමෙන් ප්‍රදේශයේ වසංගත රෝග පැතිරයාමේ අවදානමක් පැවතිණි.	දිරන කසළ වැල්ලමඩම මෝලවත්ත නැමති රජයේ ඉඩමට බැහැර කොට පස් දමා වසන බව හා නොදිරන කසළ ලෙස පිරිසිදු පොලිතීන් හා ප්ලාස්ටික් එකතු කර සභාව සතු වාහන අංගනයෙහි නව ගොඩනැගිල්ලක් ඉදි කර ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරන තෙක් ගබඩා කර ඇති බව.	කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේදී වැල්ලමඩම ප්‍රදේශයේදී අනතුරට පත්ව තිබුණු බැකෝ යන්ත්‍රයට අදාළ රු.170,000 ක් වූ අලාභය මුදල් රෙගුලාසි 104(4) වාර්තාව අනුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ගන්දර පොලිසියේ පැමිණිල්ලක් අදාළ පාර්ශවයන්ට එරෙහිව සිදුකරන ලද බවත් පැමිණිල්ලට විරුද්ධව හිටපු සභාපතිවරයා විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවට කරන ලද ලිඛිත ඉල්ලීමකට අනුව, සවිස්තරාත්මක වාර්තාවක් පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇති බව.	අලාභය කඩිනමින් වගකිවයුතු පාර්ශවයන් ගෙන් අයකර ගත යුතුය.

(ආ)	සභා බලප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කටයුතු කිරීම සඳහා 2024 මැයි සිට සැප්තැම්බර් දක්වා කුලී පදනමට ලබාගත් ලොරි රථයක් සඳහා රු.මිලියන 0.51 ක කුලියක් ගෙවා තිබුණ ද මාසිකව ගිවිසුම් අළුත්කර නොතිබූ අතර, දිනකට රු.3,400 බැගින් ගෙවීම් කර තිබූ නමුත් ධාවනය කළ දුර ප්‍රමාණය හා ඉටු කළ රාජකාරි පිළිබඳව අධීක්ෂණ නිලධාරියකු නිර්දේශ කර නොතිබුණි.	පැන නැගුණු ගැටළු මත නැවත මිල ගණන් කැඳවීමට කාලයක් නොමැති බැවින් ටෙන්ඩර් පෙට්ටියට බහාලන ලද මිල ගණන් පිළිගැනීමට කටයුතු කරන ලද බවත් මින් ඉදිරියට එවැනි අඩුපාඩු සිදුවීම වලක්වා ගැනීමට කටයුතු කරන බව හා පෙන්වා දී ඇති පරිදි ගිවිසුම මාසිකව යාවත්කාලීන නොවූ බව පිළිගන්නා බව.	අවශ්‍යතා පිළිබඳ පිරිවිතරයන් සඳහන් කළ යුතු අතර ගිවිසුම මාසිකව යාවත්කාලීන කළ යුතුය.
(ඇ)	සභාව නමින් ලේඛණගත කර තිබූ නමුත් හඳුනා නොගත් ඉඩම් කැබලි 05 ක්, සභාව විසින් පරිහරණය කරනු ලබන නමුත් පැවරුම් සහතික නොගත් ඉඩම් කැබලි 14 ක් හා හිමිකම් ඔප්පු රහිත ඉඩම් කැබලි 12 ක් නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	පවරා නොගත් ඉඩම්වල භුක්තිය හා අයිතිය සොයා බලා මැනුම් කටයුතු සිදුකිරීම සඳහා එකඟතාවය ලබාදෙන ලෙස දන්වා ඇති බව.	හඳුනා නොගත් ඉඩම් නිරවුල් කර ගැනීමටත් හිමිකම් ඔප්පු රහිත ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා ගත යුතු අතර පැවරුම් සහතික නොගත් ඉඩම් සඳහා පැවරුම් සහතික ලබා ගත යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ ඇසළ සල්පිල සඳහා දෙවිනුවර වෙළෙඳ ප්‍රජාව වෙත වෙන්කර තිබූ කඩ හා බිම් අල්ලි 176 න් 166 ක් ආණ්ඩුකාරවයාරගේ ලිඛිත අවසරයකින් තොරව ලංසු මුදලින් සියයට 5 ක වට්ටමක් යටතේ ලබාදීම නිසා සභා අරමුදලට රු.212,790 ක පාඩුවක් සිදුව තිබුණි. එසේම ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ඇසල සල්පිලෙහි කාර්ය මණ්ඩලය සඳහා වැටුප් අත්තිකාරම් ලබාදීමට රු.900,000 ක් වැය කර තිබුණි.	ප්‍රාදේශීය සභා අරමුදලට වැඩි ලාභයක් ලබා ගැනීමේ අරමුණින් එවකට සිටි පළාත් පාලන සහකාර කොමසාරිස් හා පළාත් පාලන කොමසාරිස් තුමන්ලාගේ සහයෝගය ඇතිව කඩ හා බිම් අල්ලි ප්‍රසම්පාදන ක්‍රමවේදයකට අනුව අලෙවි කිරීමට ප්‍රථම වරට සකස්කර ගන්නා ලද බව හා එවකට පැවති සභාවන් විසින් යෝජනා සම්මතයෙන් සිදුකර ඇති බව.	ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ නොවේ නම් වගකිවයුතු නිලධාරීන්ගෙන් එම පාඩුව අයකර ගත යුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට ලබාදීම සඳහා පොත් 20,200 ක් ලබාගැනීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී රු.මිලියන 4.7 ක ඉන්වොයිසියක් ලබාදී තිබූ අතර, මේ සඳහා මිලගණන් කැඳවීම 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 207 හා 208 සහ 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට බැහැරව ක්‍රියාකර තිබුණි. ප්‍රතිලාභීන් නිශ්චිතව හඳුනාගෙන නොතිබූ නමුත් 2023 පෙබරවාරි 06 දින වන විට පොත් ඇණවුම්	නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණද මෙම කාරණාව සම්බන්ධව අවසන් තීරණය ගන්නා තෙක් සභාව මඟින් පොත් සැපයීම සම්බන්ධව කිසිදු ගෙවීමක් සිදු නොකරන ලෙස දැනුම් දී ඇති බව හා මේ හේතුව නිසා ගෙවීම් සම්බන්ධයෙන් සමාලෝචිත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකරන ලද බව.	මූල්‍ය හා පරිපාලන රීති, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, නීතිමය ක්‍රියාවලිය අවසන් වනතුරු ගෙවීම් නතර කළ යුතුය.

කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන්ට බෙදාදීමෙන් තොරව ලබාගත් පොත් ගබඩාවේ තැන්පත් කර තිබුණි. එමෙන්ම එම පොත්වල GSM අගය 56 ක් විය යුතු නමුත් පොතක GSM අගය 55 ක් වී තිබුණි. පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් නොගෙවීම සම්බන්ධව අදාළ පෞද්ගලික සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු නමුත්, ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු ගන්දර පැරණි පුස්තකාල ගොඩනැගිල්ල හා දෙව්සිරිගම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවති අතර, ඒවා ආදායම් උත්පාදනය කර ගත හැකි ඵලදායි කාර්යයකට යොදවා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	සභාව සතු පැරණි පුස්තකාල ගොඩනැගිල්ල හා දෙව්සිරිගම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතිමට හේතු වී ඇත්තේ එය ගරා වැටීමට ලක් වීම නිසා බව.	පරීක්ෂා කර බලා ඵලදායි කාර්යයකට යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් පාලන ආයතන විසින් මහජනයා වෙත ලබාදෙන සේවා පහසු කිරීම, කාර්යක්ෂම කිරීම සහ ආදායම් කඩිනමින් රැස්කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේද හඳුන්වාදීම අනිවාර්ය බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 2022/01 මඟින් දන්වා තිබූ නමුත් සභාව එසේ සිදුකර නොතිබුණි.	LGPMS මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට දත්ත ඇතුළත් කරමින් පවතින බව.	චක්‍රලේඛය අනුව මාර්ගගත ක්‍රමවේදය නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ ස්ථාපිත කළ යුතුයි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙවිනුවර වරාය මාර්ගය තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා 2023 වර්ෂයේ දී රු.මිලියන 01 ක මුදලක් ගෙවා තිබූ නමුත් මාර්ගයේ ස්ථාන 08 ක තාර ඇතුරුම ගැලවී ගොස් තිබුණි.	දැනට ප්‍රතිසංස්කරණය කර ඇති බව	ව්‍යාපෘතිය නිසි ප්‍රමිතියෙන් ඉටු නොකිරීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේවක සංඛ්‍යා සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට තනතුරු 31 ක අතිරික්තතා පැවතුණි.	තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	කාර්යමණ්ඩලයේ අතිරික්ත තනතුරු සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	**සේවක ණය**		
	සභාවේ සේවය කළ සේවය හැරගිය හා විශ්‍රාම ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.306,137 ක ණය ශේෂ වසර 2 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් කමිටු තීරණ අනුව නීතිමය කටයුතු කිරීමට නිර්දේශ කර ඇති බව.	කඩිනමින් නීතිමය කටයුතු සිදුකර ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.